රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387(IV).

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1988 මැයි මස 16 වැනි දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**1988 නව ඒකාබද්ධ වැටුප් - පරිපාලන ප්‍රතිසංස්කරණ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම - වැටුප් හා සේවක සංඛ්‍යා. 1987 දෙසැම්බර් මස 11 දිනැති අංක 387 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන**

1987 දෙසැම්බර් මස 11 දිනැති අංක 387 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, 1988 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත දැක්වෙන අන්දමට සංශෝධනය කෙරේ.

01. (අ) මෙම චක්‍රලේඛයේ ඇමුණුම් I හි දැක්වෙන පරිදි, එහි වැටුප් පරිමාණ 37 ක් සංශෝධනය කෙරේ. ඒ අනුව, ඇමුණුමේ 3 වන තීරුවේ සඳහන් වැටුප් පරිමාණ 37 වෙනුවට, එහි 5 වන තීරුවේ සඳහන් සංශෝධිත වැටුප් පරිමාණ 37 යොදාගත යුතුය.

(ආ) වැටුප් පරිවර්තන චක්‍ර, සංශෝධිත වැටුප් පරිමාණයන්හි ආරම්භයේ සිට උපරිමය දක්වා, පියවරෙන් පියවර පරිවර්තනය කිරීමේ පදනම මත, මෙම චක්‍රලේඛයේ ඇමුණුම් II හි දැක්වෙන උදාහරණය පරිදි සකසා ගත යුතුය. වැටුප් ගෙවිය යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 387 හි I වන ඡේදයේ විධිවිධානයන් අනුවය.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387හි 57 වන පිටුවේ සඳහන් ආර්-4-I වැටුප් පරිමාණය හා 58 වන පිටුවේ ඇති ඊට අදාළ පරිවර්තන චක්‍ර අවලංගු කෙරේ. ඒ වෙනුවට පහත සඳහන් පරිදි ඇමුණුම් Iහි දැක්වෙන සංශෝධිත ආර්-3-5, ආර්-3-6, ආර්-3-7 හා ආර්-3-8 යන වැටුප් පරිමාණ පිළිවෙලින් යොදාගත යුතුය.

| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 327හි වැටුප් බණ්ඩය | සංශෝධිත වැටුප් බණ්ඩය |
|---|---|
| 34-3:1 | ආර්-3-5 |
| 33-3:2 | ආර්-3-6 |
| 32-3:3 | ආර්-3-7 |
| 31-4:1 | ආර්-3-8 |

03. <u>ජීවන වියදම් දීමනාව</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387 හි 05.(අ) ඡේදයේ පළවන කොටස ඉවත්කර (තිදසුන හැර) ඒ වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කරන්න.

> "05. ජීවන වියදම් දීමනාව - (අ) රජයේ නිලධාරියෙකුට දැනට ගෙවන ස්ථාවර ජීවන වියදම් දීමනාව 1988.01.01 දින සිට ගෙවනු නොලැබේ. 1988 නව ඒකාබද්ධ වැටුප්වල ආරම්භක වාර්ෂික ඒකාබද්ධ වැටුප රු.35,700/=ට අඩු හා ආරම්භක වැටුප් වර්ධකවල අගය රු.1,200/=ට අඩු වැටුප් පරිමාණයක සිටින නිලධාරීන්ට පමණක්, 1988.01.01 දින සිට ජීවන වියදම් දීමනාවක් ගෙවනු ලැබේ. මෙම දීමනාව ජීවන වියදම් දර්ශකයට (කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය) සම්බන්ධිත වන අතර, ජීවන වියදම් දර්ශකයෙහි ඇතිවන වෙනස්වීම් වලට අනුකූලව වෙනස් වනු ඇත. කිසියම් මාසයක් සඳහා වන දීමනාව ඉකුත් මාසයේහි ජීවන වියදම් දර්ශකය මත පදනම් වනු ඇත. ජීවන වියදම් දීමනාව ගණනය කිරීමෙහි ලා 612 පාදක දර්ශකය වශයෙන් ගත යුතුය. මෙම පාදක දර්ශකයෙන් එක් ඒකකයක් ඉහළ/පහළ යෑමෙන් වන වෙනසට, රු.2/=ක් බැගින් මෙම දීමනාව වැඩි/අඩු විය යුතුය".

04. <u>සංයුක්ත දීමනාව</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387හි 13 වන ඡේදයේ අවසානයට පහත දැක්වෙන සටහන එකතු කල යුතුය.

සටහන: 1987.12.31 දිනට ඉහත සඳහන් සංයුක්ත දීමනා ප්‍රමාණයන් ලබාගත් නිලධාරියෙකුට එහුට පෞද්ගලික වන සේ එම අනුග්‍රහය ලබාගැනීමට තවදුරටත් ඉඩ දෙනු ඇත.

05. <u>වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගැනීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387හි 17 වන ඡේදය ඉවත්කර, පහත සඳහන් ඡේදය ආදේශ කරන්න.

> "17. වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් අයකර ගැනීම - අඩුකර ගැනීමේ ප්‍රමාණ පහත දැක්වෙන පරිදි වේ.--

| 1988 නව ඒකාබද්ධ වැටුප් (වාර්ෂික) | |
|---|---|
| රු. 17,280/- දක්වා | 1 1/2% (එකහමාරයි) |
| රු. 17,281/- සිට 28,800/- දක්වා | 3% (තුනයි) |
| රු. 28,801/- සහ ඊට වැඩි | 4% (හතරයි)" |

06. දුම්රිය ගමන් බලපත්‍ර සහ නිවාඩු ගමන්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 387 හි 21 ඡේදය (සටහන් I සහ සටහන් II හැර) ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරන්න.

"21. දුම්රිය ගමන් බලපත්‍ර සහ නිවාඩු ගමන්. - ගමන් කළහැකි පන්තිය පහත දැක්වෙන පරිදි තීරණය කෙරෙනු ඇත. -

| 1988 නව ඒකාබද්ධ වැටුප් (වාර්ෂික) | | |
|---|---|---|
| 1 වන පන්තිය | - | රු.31,200/- සහ ඊට වැඩියෙන් ලබන නිලධාරියෙකු |
| 2 වන පන්තිය | - | රු.22,800/- සහ ඊට වැඩියෙන් ලබන නිලධාරියෙකු |
| 3 වන පන්තිය | - | අනෙක් සියලු අය." |

07. මාණ්ඩලික නිලධාරියා, යටත් නිලධාරියා, කණිෂ්ඨ සේවකයා

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387 හි 22.(අ), (ආ), සහ (ඇ) ඡේද ඉවත් කර, පහත සඳහන් ඡේද ආදේශ කරන්න.

"22.(අ) මාණ්ඩලික නිලධාරියා. - 1988 නව ඒකාබද්ධ වැටුප්වල ආරම්භක වාර්ෂික ඒකාබද්ධ වැටුප රු.27,000/- හෝ ඊට වැඩිවූද, රු.600/- හෝ ඊට වැඩි වාර්ෂික වැටුප් වර්ධක සහිත වූද, වැටුප් පරිමාණයකට හිමිකම් ලබන නිලධාරියෙකු අදහස් කෙරේ.

(ආ) යටත් නිලධාරියා. - 1988 නව ඒකාබද්ධ වැටුප්වල රු.17,280/- හෝ ඊට වැඩි ආරම්භක ඒකාබද්ධ වාර්ෂික වැටුපක් සහිත වැටුප් පරිමාණයකට හිමිකම් ලබන්නා වූද, ඉහත 22(අ) ගණයට අයත් නොවන්නාවූද නිලධාරියෙකු අදහස් කෙරේ.

(ඇ) කණිෂ්ඨ සේවකයා. - 1988 නව ඒකාබද්ධ වැටුප්වල රු.16,560/- හෝ ඊට අඩු ආරම්භක වාර්ෂික ඒකාබද්ධ වැටුපක් සහිත වැටුප් පරිමාණයකට හිමිකම් ලබන නිලධාරියෙකු අදහස් කෙරේ."

08. දෛනික වැටුප්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387 හි 23 ඡේදය ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කරන්න.

"23. දෛනික වැටුප්. - දෛනික වැටුප් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 387 හි III වන පරිශිෂ්ඨය වෙනුවට, මෙම චක්‍රලේඛයේ ඇමුණුම් III ආදේශ කරනු ලැබේ. ඒ අනුව, දෛනික වැටුප් ගෙවිය යුත්තේ ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ 9 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුවය. 1986.06.16 දිනැති අංක 327(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5 වන ඡේදය 1988.01.01 දින සිට අවලංගු කෙරේ. ඒ අනුව ඇමුණුම් III හි දැක්වෙන දෛනික වැටුපට අමතරව ගෙවිය යුත්තේ 5.(ආ) ඡේදයේ දැක්වෙන ජීවන වියදම් දීමනාව පමණි."

09. දීමනා

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.387 හි III පරිශිෂ්ඨයේ, පහත සඳහන් තනතුරුවලට අදාල වූ දීමනා, එම තනතුරුවලට ඉදිරියෙන් දක්වා ඇති පරිදි සංශෝධනය කෙරේ. -

දීමනා

| තනතුර | 1988.01.01 දින සිට 1988.12.31 දිනතෙක් ගෙවිය යුතු දීමනා | 1989.01.01 දින සිට ගෙවිය යුතු දීමනා |
|---|---|---|
| | රු. | රු. |
| සංගීත හා නැටුම් උපදේශක (අධිකාලීන) සමාජසේවා | 14,640 | 19,680 |
| ආධුනික වෛද්‍ය නිලධාරී-සෞඛ්‍ය | 25,500 | 33,000 |
| ජ්‍යෙෂ්ඨ වෛද්‍ය (අධිකාලීන) ආයුර්වේද | 14,640 | 19,680 |
| රෝග නිධානඥ (අධිකාලීන) ආයුර්වේද | 19,200 | 25,200 |

10. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

ඇමුණුම - 1
இணைப்பு - 1
Annexe- 1

| 1 | වැටුප් ඛණ්ඩය<br>சம்பளத்தொகுதி<br>Salary Group<br>2 | රා.ප.ච. චක්‍රලේඛ 387 හි වැටුප් පරිමාණය<br>அ.நி. சுற்றறிக்கை இல.387இன்படி சம்பளத் திட்டம்<br>Salary Scale as per P.A. Circular 387<br>3 | වැටුප් ඛණ්ඩය<br>சம்பளத் தொகுதி<br>Salary Group<br>4 | සංශෝධිත වැටුප් පරිමාණය<br>திருத்தப்பட்ட சம்பளத்திட்டம்<br>Revised Salary Scale<br>5 |
|---|---|---|---|---|
| 1. | R-2-1 | Rs.16,800-15x480-6x600-27,600 | R-2-1 | Rs.17,280-14x480-6x600-27,600 |
| 2. | R-2-2 | Rs.18,240-12x480-8x600-28,800 | R-2-2 | Rs.19,680-9x480-8x600-28,800 |
| 3. | R-2-3 | Rs.19,680-9x480-11x600-30,600 | R-2-3 | Rs.21,600-5x480-11x600-30,600 |
| 4. | R-2-4 | Rs.21,120-6x480-14x600-32,400 | R-2-4 | Rs.23,040-2x480-14x600-32,400 |
| 5. | R-2-5 | Rs.22,560-3x480-15x600-33,000 | R-2-5 | Rs.25,200-13x600-33,000 |
| 6. | R-3-1 | Rs.18,000-10x480-10x600-28,800 | R-3-1 | Rs.19,440-7x480-10x600-28,800 |
| 7. | R-3-2 | Rs.19,440-7x480-11x600-29,400 | R-3-2 | Rs.21,360-3x480-11x600-29,400 |
| 8. | R-3-3 | Rs.20,880-4x480-11x600-2x900-31,200 | R-3-3 | Rs.23,400-10x600-2x900-31,200 |
| 9. | R-3-4 | Rs.22,320-1x480-11x600-5x900-33,900 | R-3-4 | Rs.25,200-7x600-5x900-33,900 |
| 10. | R-3-5 | Rs.24,000-9x600-8x900-36,600 | R-3-5 | Rs.27,000-4x600-11x900-39,300 |
| 11. | R-3-6 | Rs.25,200-7x600-9x900-37,500 | R-3-6 | Rs.28,800-1x600-11x900-39,300 |
| 12. | R-3-7 | Rs.26,400-5x600-14x900-42,000 | R-3-7 | Rs.31,200-12x900-42,000 |
| 13. | R-3-8 | Rs.27,600-3x600-14x900-42,000 | R-3-8 | Rs.33,000-10x900-42,000 |
| 14. | R-5-2 | Rs.37,200-14x1200-54,000 | R-5-2 | Rs.38,400-13x1200-54,000 |
| 15. | R-5-3 | Rs.38,400-13x1200-54,000 | R-5-3 | Rs.40,800-11x1200-54,000 |
| 16. | R-5-4 | Rs.39,600-12x1200-54,000 | R-5-4 | Rs.43,200-9x1200-54,000 |
| 17. | R-5-5 | Rs.40,800-11x1200-54,000 | R-5-5 | Rs.45,600-7x1200-54,000 |
| 18. | R-5-6 | Rs.42,000-10x1200-54,000 | R-5-6 | Rs.48,000-5x1200-54,000 |

14...

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| 19. | R-5-7 | Rs.43,200-9x1200-54,000 | R-5-7 | Rs.50,400-3x1200-54,000 |
| 20. | R-5-8 | Rs.44,400-8x1200-54,000 | R-5-8 | Rs.51,600-2x1200-54,000 |
| 21. | R-5-9 | Rs.45,600-7x1200-54,000 | R-5-9 | Rs.52,800-1x1200-54,000 |
| 22. | R-5-10 | Rs.46,800-6x1200-54,000 | R-5-10 | Rs.54,000 (fixed) |
| 23. | R-6-1 | Rs.48,000-4x1800-7x2400-72,000 | R-6-1 | Rs.55,200-7x2400-72,000 |
| 24. | R-6-2 | Rs.49,800-3x1800-7x2400-72,000 | R-6-2 | Rs.57,600-6x2400-72,000 |
| 25. | R-6-3 | Rs.51,600-2x1800-7x2400-72,000 | R-6-3 | Rs.60,000-5x2400-72,000 |
| 26. | R-6-4 | Rs.53,400-1x1800-7x2400-72,000 | R-6-4 | Rs.62,400-4x2400-72,000 |
| 27. | NIL | NIL | R-10-1(A) | Rs.38,400-3x1200-4x1800-2x2400-54,000 |
| 28. | R-10-3 | Rs.48,000-4x1800-7x2400-72,000 | R-10-3 | Rs.55,200-7x2400-72,000 |
| 29. | R-11-1 | Rs.21,480-4x480-10x600-6x900-34,800 | R-11-1 | Rs.23,400-10x600-6x900-34,800 |
| 30. | R-11-2 | Rs.22,920-1x480-10x600-9x900-37,500 | R-11-2 | Rs.25,800-6x600-9x900-37,500 |
| 31. | R-11-3 | Rs.24,000-9x600-10x900-1x1200-39,600 | R-11-3 | Rs.27,000-4x600-10x900-1x1200-39,600 |
| 32. | R-11-4 | Rs.25,200-7x600-10x900-3x1200-42,000 | R-11-4 | Rs.28,800-1x600-10x900-3x1200-42,000 |
| 33. | R-11-5 | Rs.26,400-5x600-10x900-10x1200-50,400 | R-11-5 | Rs.31,200-8x900-10x1200-50,400 |
| 34. | R-12-8 | Rs.48,000-5x1800-57,000 | R-12-8 | Rs.55,200-1x1800-57,000 |
| 35. | R-12-9 | Rs.46,800-6x1200-54,000 | R-12-9 | Rs.54,000 (fixed) |
| 36. | R-14-1 | Rs.22,560-3x480-15x600-33,000 | R-14-1 | Rs.25,200-13x600-33,000 |
| 37. | R-14-3 | Rs.48,000-4x1800-7x2400-72,000 | R-14-3 | Rs.55,200-7x2400-72,000 |

15...6

ඇමුණුම - II
இணைப்பு-11
Annexe - II

උදාහරණය / உதாரணம்/Example

| රා.පරි.ච. 327 හි වැටුප් බණ්ඩය සහ පරිමාණය<br>அ.நி. சுற்றறிக்கை 327இன்படி சம்பளத் தொகுதியும், திட்டமும்<br>Salary Group and Scale of P.A. Circular 327 | සංශෝධිත නව වැටුප් බණ්ඩය සහ පරිමාණය<br>திருத்தப்பட்ட சம்பளத் திட்டம், தொகுதி<br>Revised New Salary Group and Scale |
|---|---|
| 39 - 1:2 බී ( 18 වෙනි පිටුව )<br>39-1:2பி( 18ஆம் பக்கம்)<br>39- 1:2 B (Page 18 ) | ආර් / ஆர்/R - 2-1 |
| රු/ ரூபா / Rs.<br>8,640-2x240-9,120/9,600-6x240-11,040/11,760-9x360-15,000 | 17,280-14x480-6x600-27,600 |

පරිවර්තන වගුව / மாற்ற அட்டவணை/Conversion Table

| වර්තමාන වැටුප<br>தற்போதைய சம்பளம்<br>Present Scale | නව වැටුප<br>புதிய சம்பளம்<br>New Scale |
|---|---|
| 8,640 | 17,280 |
| 8,880 | 17,760 |
| 9,120 | 18,240 |
| 9,600 | 18,720 |
| 9,840 | 19,200 |
| 10,080 | 19,680 |
| 10,320 | 20,160 |
| 10,560 | 20,640 |
| 10,800 | 21,120 |
| 11,040 | 21,600 |
| 11,760 | 22,080 |
| 12,120 | 22,560 |
| 12,480 | 23.040 |
| 12,840 | 23,520 |
| 13,200. | 24,000 |
| 13,560 | 24,600 |
| 13,920 | 25,200 |
| 14,280 | 25,800 |
| 14,640 | 26,400 |
| 15,000 | 27,000 |
| 15,480 | 27,600 |

III පරිශිෂ්ඨය

ඇමුණුම III

**දෛනික වැටුප**

| | වර්තමාන වැටුප | 1988.07.01 දින සිට 1988.12.31 දක්වා ගෙවිය යුතු වැටුප | 1989.01.01 දින සිට ගෙවිය යුතු වැටුප |
|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත |
| ඇස්කිසි නිලධාරී-ජාතික නිවාස | 23.40 | 50.04 | 55.20 |
| නවාතැන් බංගලා සහකරු-දුම්රිය - | | | |
| වයස අවු.16 ට වැඩි | 14.00 | 33.04 | 33.60 |
| වයස අවු.17 ට වැඩි | 15.00 | 35.40 | 36.00 |
| වයස අවු.18 ට වැඩි | 16.00 | 37.20 | 38.40 |
| සුළු පරිපාලක I ශ්‍රේණිය | 25.20 | 54.95 | 62.87 |
| සුළු පරිපාලක II ශ්‍රේණිය | 22.50 | 54.95 | 62.87 |
| තේරීම් ශ්‍රේණිය | 25.20 | 54.95 | 62.87 |
| කම්කරු ශ්‍රේණි සේවකයින් - | | | |
| I පන්තිය I ශ්‍රේණිය | 23.20 | 54.95 | 62.87 |
| I පන්තිය II ශ්‍රේණිය | 22.00 | 50.04 | 55.20 |
| II පන්තිය | 21.40 | 46.94 | 51.40 |
| III පන්තිය | 20.00 | 44.40 | 48.00 |
| කාර්යාල කම්කරු (කම්කරු ශ්‍රේණියේ සේවකයින් හැර) | 20.00 | 44.40 | 48.00 |
| මුරකරුවන් | 21.40 | 46.94 | 51.40 |
| පණිවුඩකරුවන් | 21.40 | 46.94 | 51.40 |
| බයිසිකල් පණිවුඩකරුවන් | 21.40 | 46.94 | 51.40 |
| කාර්යාල කාර්ය සහායක | 21.40 | 46.94 | 51.40 |
| වතු කම්කරු | 20.00 | 44.40 | 48.00 |
| අම්බලන්නා | 20.00 | 44.40 | 48.00 |
| අනුපිටපත් ක්‍රියාකරවන්නා | 22.00 | 48.05 | 52.90 |
| පොත් බඳුම්කරුවන් | 22.00 | 48.05 | 52.90 |
| සනීපාරක්ෂක කම්කරු | 20.00 | 44.40 | 48.00 |
| ඖෂධ සංයෝජක | 21.40 | 50.04 | 55.20 |
| අරක්කැමි | 21.40 | 46.94 | 51.40 |
| උපස්ථායක | 21.40 | 46.94 | 51.40 |
| විත්තලු | 22.00 | 50.04 | 55.20 |
| දුරකථන ක්‍රියාකරවන්නන් | 22.00 | 48.05 | 52.90 |
| යතුරුලේඛක | 23.40 | 50.04 | 55.20 |
| ලිපිකරුවන් | 23.40 | 50.04 | 55.20 |
| ලඝුලේඛකයින් (II පන්තිය) | 26.70 | 54.95 | 62.87 |
| ලඝුලේඛකයින් (I පන්තිය) | 36.70 | 67.00 | 80.51 |
| මෝටර් රථ රියදුරු (II පන්තිය 'ආ' ඛණ්ඩය) | 22.00 | 48.05 | 52.90 |
| මෝටර් රථ රියදුරු (II පන්තිය 'අ' ඛණ්ඩය | 23.40 | 50.04 | 55.20 |
| මෝටර් රථ රියදුරු (I පන්තිය) | 25.00 | 54.95 | 62.87 |

| | | | |
|---|---|---|---|
| සැලසුම්කරුවන් | 36.70 | 57.80 | 62.10 |
| භාෂා පරිබර්තකයින් | 32.00 | 67.00 | 80.51 |
| භාෂා පරිවර්තකයින් (උපාධිධාරී) | 36.70 | 72.75 | 92.01 |